# NEWSLETTER
## USJP-PALI BUDDHIST
## DPBS-USJP-2018

Prosper Lives through Learning

**Department of Pali and Buddhist Studies**
**University of Sri Jayewardenepura.**


## 14th Int'l Conference on

# PALI & BUDDHIST STUDIES ICPBS 2018

Annual International conference on Pali and Buddhist Studies, organized by the Dept. of Pali and Buddhist Studies will be held at Sumangala Reading Hall, Faculty of Humanities and Social Sciences, University of Sri Jayewardenepura on 19th December 2018.

This conference will be held for 14th time with the collaborative effort of the academic and non-academic members of the Department. The keynote address will be delivered by the Prof. Soonil Hwang, Dean, the College of Buddhist Studies in Dongguk University in Seoul, South Korea. The Chairperson of the conference is Ven. E. Sarananda and the Secretary is Mr. G.A. Gamini and it is organized under the guidance of Ven. Prof. M. Wijithadhamma, Head of the Department of Pali and Buddhist Studies.

**Mission**
To create and disseminate knowledge for the prosperity of the nation, drawing inspiration from our cultural heritage.

## Message from the Head of the Department

The Department of Pali and Buddhist Studies has its own prestige for disseminating knowledge to the world relating to several subjects. It is indeed a great pleasure for me to greet you with a message to this annual newsletter. Through this newsletter we are looking forward to maintaining a discourse beyond relationship with academics, students and society. DPBS could join hands for a meaningful exchange of news, views and opinions in the subject areas of Pali and Buddhist Studies. It is also part of our aim to bridge the gap between the Department and the wider community as well as the non-university communities those who interested in the activities of the Department. We are willing to share the Departmental views, news, knowledge and skills with all of them through this newsletter. I wish with for the continuation of this newsletter to a glorious future.

**Ven. Prof. M. Wijithadhamma**

Edd. & Designed By :
**Mr. J.A.D.Panchana**
DPBS_FHSS@USJP

# New Promotions





**Dr. K.A. Weerasena** and **Dr. M. D. D. I. Gunathilaka** have been promoted to Professorial level who represent fields of Buddhist Civilization and Pali.

---

## The Prestigious 'Buddhist Literary Award-2018' for
## Ven. Prof. M. Wijithadhamma



Ven. **Prof. M. Wijithadhamma**, Head of the Department of Pali and Buddhist Studies, in the Faculty of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura was awarded the prestigious "Buddhist Literary Award-2018' for his latest work, **"Dasa – bodhisattuppatti - kathā Aṭṭhakathā"** (දස බෝධිසත්තුප්පත්ති කථා අට්ඨකථා) **(Commentary on the Birth Stories of Ten (Future) Bodhisatvas)**. The award for the Best Academic Research was presented by Most Venerable Mahanayaka Thera of Asgiriya Chapter of Siam Mahanikaya at the **"Buddhist Literary Awards Ceremony – 2018"** held on 14th September 2018 at BMICH, Colombo.

## Successfully completed two Diploma Courses

The Department of Pali and Buddhist Studies has successfully completed two Diploma courses; Diploma in Buddhist Studies and Diploma in Pali in 2018. The Buddhist Study Diploma which was taught in Sinhala was coordinated by Ven. K. Vineetha. The Pali Diploma was opened for foreign students only.

## මහාචාර්ය කේ.ඒ.වීරසේන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ...

ජාතික අධ්‍යාපන ආයතනයෙහි 2018.09.23 හා 24 දෙදින තුළ පැවැති උසස් පෙළ බුද්ධ ධර්මය විෂය සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩමුළුව සඳහා සම්පත් දායකත්වය ලබා දී ඇත.

2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත 6,7,8,9,10,11 ශ්‍රේණිවලට අදාළ බුද්ධ ධර්මය විෂයෙහි විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා පෙළපොත් සකස් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරයි.

**"කස්සච්චයා නෙහ භවන්ති"**

කාගේ නම් දොස් නැත්තේ ද?

# New Admissions for Diploma in Pali -2019

Applications are open for the Diploma in Pali -2019 from foreign students. Application are issued by the Department of Pali and Buddhist Studies.

- **Duration: One Year (only in Saturdays)**
- **Date of Commence: 05 January 2019**
- **Course Fee: USD 275 (Rs. 40000.00)**
- **Medium: English**

Coordinator : Ven. Prof. M. Wijithadhamma
Contact: +94714511863, wijithadhamma@sjp.ac.lk

# බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව 2019

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය මඟින් පවත්වනු ලබන බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ඇතුළත් වීමේ සුදුසුකම් : අ.පො.ස සා/පෙළ විභාගයෙන් සම්මාන තුනක් සහිත ව විෂයයන් 6ක් සමත් වී තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් තිබීම
- කාලයඃ අවුරුදු 01, මාධ්‍යයඃ සිංහල
- පාඨමාලා ගාස්තුව රු.20,000.00
- වැඩිදුර තොරතුරු සඳහා : http://fhss.sjp.ac.lk/news/diploma-in-buddhist-studies-2/

සම්බන්ධීකාරක :
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එළමල්දෙණියේ සාරානන්ද හිමි
+94714437192, e.sarananda@gmail.com

## Ven. K. Vineetha on Vesak in Jordan



Ven. K. Vineetha visited Jordan for Vesak in last may by the invitation of Sri Lankan Embassy of Jordan. Ven. Thera contributed a lot in dhamma those who are in Jordan.

## Diploma Students Visit to Rajagala



The students of Diploma in Buddhist Studies visited Rajagala for a field study from 1-2 December. Rajagala Archaeological Reserve in Ampara have that the relics of Arahant Mahinda relics have been enshrined there.

# මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියෝ ජාතික හා ජාත්‍යන්තර සේවාවන් රැසක...



මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියන් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මහඟු සේවාවන් රැසක නිරතවන හිමිනමකි. උන්වහන්සේ 2018 වර්ෂය තුළ සිදුකළ සේවාවෙන් බිඳක් පහත දැක්වේ.

- 2018.09.17 ඉන්දියාවේ සාරානාත්හි අනගාරික ධර්මපාල ගුණසමරු දේශනය පැවැත්වීම.
- 2018.06.08 යක්කල ආයුර්වේද විද්‍යාලයේ "දේශීය වෙදකම හා වෙදැදුරු කාර්යභාරය" පිළිබඳ දේශනයක් පැවැත්වීම.
- Hate Speech – Special Lectu/ @OPA-Colombo 7
- 2018.06.15 "භික්ෂු නායකත්වය, විනය හා ලාංකීය සමාජය" යන මැයෙන් උපසම්පදා උත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.
- 2018.07.15 වෙස්සන්තර ජාතකය අළලා කළ "මහාමානව" නවකථාව දොරට වැඩුමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.
- 2018.08.28 "භික්ෂුවගේ ජාතික හා ආගමික කාර්යභාරය" පිළිබඳ කෝට්ටේ පැරකුම්බා පිරිවෙනේ පැවැති පිරිවෙන් සිසු පුහුණුවට සම්පත් දායකත්වය ලබා දී තිබීම.
- 2018.08.11 කතරගම කිරිවෙහෙර පූජා භූමියේ පැවැති 'විභජ්ජවාද' වැඩසටහනේ දී අටුවා පිළිබඳ දුර්මත ඛණ්ඩනය කරමින් විශේෂ දේශනයක් සිද්ධ කිරීම.
- 2018.10.06 පැපිලියානේ සෝමවීර සේනානායක සමරු දේශනය පැවැත්වීම.

---

# PUBLICATIONS

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති ධූරීණව වැඩ සිටි බෙල්ලන්විල රාජමහා විහාරාධිකාරී

**සාහිත්‍යසූරී, මහාචාර්ය බෙල්ලන්විල විමලරතනාභිධාන**

කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමාග්‍රීධර්ම මහා සංඝසභාවේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ත්‍රෛමාසික ගුණානුස්මරණය වෙනුවෙන් පළ කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහය

**සුත්තනිපාත අධ්‍යයන**

මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි
ආචාර්ය ඌරුපැලැව්වේ හේමාරාම හිමි

**මාගධී**
**MĀGADHĪ**

මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි අනුස්මරණ කලාපය

**ප්‍රධාන සංස්කාරක**
එළමල්දෙණියේ සාරානන්ද හිමි

**සහාය සංස්කාරක**
මැටිබැඹියේ ධම්මසිරි හිමි
ඇහැලේපොළ මහින්ද හිමි
දිලාන් පංචන ජයසිංහ

**Analysis on Dhamma and Vinaya**

The most venerable Delthara Seelananda Maha Thera Felicitation Volume

**Vol. I**

Editor
**Ven. Delthara Gnananda Thera**

**A Translation of Rupasiddhi Sutras**

**Ven. M. Wijithadhamma**

# "Geethanjali" Bethi Gee Saraniya 2018

**"Geethanjali Bathi Gee Saraniya"** an inter-department and inter-faculty Bathi Gee (Devotional Songs) competition organized by the Department of Pali and Buddhist Studies was held on 26th June 2018. It was a function that brought together all Departments and Faculties of the University under one roof to perform and be a part of an evening full of devotional tranquility. This event was organized by Dr. A. M. Nimal Wasantha Mendis, a Senior Lecturer in the Department of Pali and Buddhist Studies.

The event was graced by Prof. D. P. S. Chandrakumara, the Dean of the Faculty, and othe academics. Mrs. Niranjala Sarojini, Mr. Isuru Jayarathna and Mr. Lakshman Wijesekara were participated as resource persons who judged the competition.



## Two Keynote Addresses by the Head - DPBS

A Pali medium keynote address was delivered by the Ven. Prof. Medagampitiye Wijithadhamma in the 4th International Pali and Buddhist Conference on 'Bhavana-Naya-Vibhavana' held at University of Peradeniya on 30th October 2018.

---

National Council for International Affairs of All Ceylon Buddhist Congress (ACBC) organized a Buddhist Business forum on 16th October 2018 in Colombo. The Keynote Address was on Buddhist Values in Business delivered by Ven. Prof. M. Wijithadhamma.

## An Int'l Ex-co Membership for DPBS

Ven. Prof. Wijithadhamma has been appointed as an executive committee member of International Association of Theravada Buddhist Universities. The headquarters of the association is in Sitagu International Buddhist Academy, Myanmar.

## DPBS Students on Overseas Dhammaduta Programmes

Five monk students were participated in Dhammaduta Program by the invitation of Most Ven. B. Sri Saranankara; the Chief Sanghanayake of Malaysia who was the chief guest of ICPBS 2016. Ven. Dr. P. Yasassi coordinated the program which was a great opportunity to our students.

# අධර්මවාදීන්ගේ සාවද්‍ය ධර්ම විග්‍රහ, බුද්ධචරිතය හා බෞද්ධ සංස්කෘතිය සමගින් ලාංකේය ඉතිහාසය විකෘති කිරීම හමුවේ අපේ කාර්යභාරය

අන් කිසිදු කාලයක නොවූ තරමට මෙකල ශ්‍රී ලංකාව තුළ සම්බුද්ධ ධර්මය විකෘති කිරීමෙහි නියැලෙන ගිහිපැවිදි පිරිස් බිහි වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ සංස්කෘතියත් ඒ හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර ත් අපේ රටේ ප්‍රෞඪ ඉතිහාසය ත් විකෘති වෙමින් පවතියි. මහාසංඝයා වහන්සේ ත් බෞද්ධ මහජනතාව ත් ඉතා ගැඹුරින් ඒවා අධ්‍යයනය කොට හේතු යුක්තීන් සහිතව පිරිහෙලීමට අවශ්‍ය කටයුතු වහ වහා සම්පාදනය කළ යුතු වේ.

**අවබෝධ කරගත යුතු විනාශය**

1. දැනට අප සතු පාලි ත්‍රිපිටකය නියම ත්‍රිපිටකය නොවන බව ප්‍රකාශ කරන අලජ්ජී ශ්‍රමණවේශධාරීහු මේ වන විට සංඝ සමාජයට ඇතුළත් වී ඇත්තාහ. එබඳු අලජ්ජීහු අප තුන් නිකායෙන් ම පැවිදි උපසම්පදා ලබා සිටිති. ඇතැම් විට ඒ ඒ නිකායයන්හි මහානායක මාහිමිපාණන් වහන්සේලා ඒ පිළිබඳව නොදනිති.

2. ඔවුහු තමන් බුදුරජාණන් වහන්සේ වදාළ නියම ත්‍රිපිටකය දන්නා බව ත් ඒ අනුව ධර්මය විග්‍රහ කරන බව ත් කියමින් බුද්ධධර්මය විකෘති ලෙස අර්ථ කථනය කරති. පටිච්චසමුප්පාදය, ත්‍රිලක්ෂණය, නිවන ආදි සද්ධර්මයෙහි ඇතුළත් මූලික ඉගැන්වීම් සියල්ල ම පාහේ ඔවුන්ගේ සාවද්‍ය අර්ථකථනවලට භාජනය වී තිබේ. මෙහි දී ම දැනට අප සතු අට්ඨකථා ටීකා ආදියේ ඇතුළත් සියලු අර්ථකථන ඔවුහු ප්‍රතික්ෂේප කරති. බුද්ධඝෝෂ වැනි අටුවා ඇදුරන් මිථ්‍යාදෘෂ්ටිකයින් බවට පත් කර උන්වහන්සේලාගේ සියලු විවරණ හෙළා දකිති.

3. ත්‍රිපිටකයේ භාෂාව වන පාලි භාෂාව පිළිගත නොහැකි එකක් බව කියමින් පාලි වචනවලට සිංහලෙන් නිරුක්ති සැපයීම මෙම අලජ්ජීන්ගේ තවත් ක්‍රියාවකි. එය එපමණකින් නොනැවතී සිංහල වචනවලට හේතුයුක්ති රහිත නිරුක්ති දීමට ත් මොවුහු පෙළඹී සිටිති. පාලි, සිංහල හෝ වෙනත් භාෂා පිළිබඳ ව හෝ අල්ප වූ ව්‍යාකරණාත්මක හා නිරුක්ති ශාස්ත්‍රීය දැනුමක් නැති බොහෝ දෙනා මේ වන විට ඒවා සත්‍ය සේ පිළිගෙන ඇත.

4. ත්‍රිපිටකය ප්‍රධාන බෞද්ධ සාහිත්‍යයෙන් ඉදිරිපත් වී ඇති බුද්ධචරිතය ඉතා නින්දිත ලෙස මොවුහු නැවත තම අවශ්‍යතා අනුව විස්තර කරති.

5. බෞද්ධ සාහිත්‍යයෙන් ඉදිරිපත් වන බුද්ධචරිතයට අදාළ සංසිද්ධි භාරතීය පුරාවිද්‍යා සොයාගැනීම්වලින් තහවුරු වී තිබිය දී ඒවා ශ්‍රී ලංකාවට ආරෝපණය කර දැක්වීම මොවුන්ගේ ඊළඟ කටයුත්ත යි. අවිචාරවත් බවෙහි මහත්ත්වය ප්‍රකට කරමින් ඒවා පිළිගැනීමට ඇතැම් උගත් භික්ෂූහු ද මේ වන විට පෙළඹී සිටිති.

6. දැනට බෝසත්වරුන් ලෙස කිසිදු බෞද්ධ සම්ප්‍රදායයක් විසින් නොපිළිගන්නා විවිධ චරිතවලට බෝධිසත්ත්ව භාවය ආරෝපණය කරමින් ක්‍රිස්තුස් වහන්සේ, රාවණ වැන්නන් බෝසත්වරුන් සේ හඳුන්වාලීමට මොවුහු ක්‍රියා කරති.

7. බෞද්ධ සංස්කෘතියට අදාළ කුඩා අනුකුඩා සියලු චාරිත්‍ර වාරිත්‍ර හා ක්‍රියාදාම ඒවායේ නියම අර්ථ පිරිහෙළා පැහැදිලි කිරීම් මගින් නමස්කාරය මුල් කරගත් සියලු චාරිත්‍ර අර්ථශූන්‍ය කිරීමට මෙම අලජ්ජීහු දැනටම ත් කටයුතු කර අවසන් ය.

8. බුදුරජාණන් වහන්සේ ශ්‍රී ලංකාවේ උපන් බව කියමින් මෙරට ඓතිහාසික ස්ථාන සාවද්‍ය ලෙස හඳුන්වාලීම මොවුන්ගේ තවත් ක්‍රියාවකි.

## ඉහත පසුබිම තුළ අනාගතයෙහි විය හැකි දේ

1. දැනට අප සතු පාලි ත්‍රිපිටකය නියම ත්‍රිපිටකය නොවන බව ත් එහි ඇති කරුණු සාවද්‍ය බව ත් සමාජයට ඒත්තු ගැන්වීමෙන් බුදුදහම විසින් ඉදිරිපත් කරනු ලබන සියලු ඉගැන්වීම් පදනම් විරහිත බව තහවුරු කිරීම මෙම අලජ්ජීන්ගේ වෑයම යි.

2. බුදුරජාණන් වහන්සේ ලංකාවේ උපන් බවට කරුණු දක්වමින් මොවුන් කරනුයේ උන්වහන්සේ ඓතිහාසිකව ජීවත් නොවූ කෙනෙකු බව තහවුරු කිරීම යි. භාරතීය පුරාවිද්‍යා සොයාගැනීම්වලින් බුද්ධචරිතය හා සම්බන්ධ ඓතිහාසිකත්වය තහවුරු වී තිබිය දී ඒවා ශ්‍රී ලංකාවට ආරෝපණය කර පෙන්වාලීමට මෙවන් පිරිස් ක්‍රියා කරන්නේ ඒ සඳහා ය. බුදුරජාණන් වහන්සේ ඓතිහාසිකව ජීවත් වූ කෙනෙකු නොවන බව තහවුරු කරගත හොත් ත්‍රිපිටකයේ ඓතිහාසිකත්වය ද ඉබේ ම අහෝසි කළ හැකිය. මොවුන්ගේ සියලු ක්‍රියාදාම ඒ සඳහා ය.

3. දැනට බෝසත්වරුන් ලෙස කිසිදු බෞද්ධ සම්ප්‍රදායයක් විසින් නොපිළිගන්නා විවිධ චරිතවලට බෝධිසත්ත්ව භාවය ආරෝපණය කිරීමෙන් බුදුරජාණන් වහන්සේගේ අතීත භව පිළිබඳ සියලු විස්තර පදනම් විරහිත වී යයි. නව බෝසත්වරුන් නිර්මාණය වූ විට බෞද්ධ සම්ප්‍රදාය පිළිගන්නා බෝධිසත්ත්ව චරිතය අවම වටිනාකම් ඇත්තක් බවට පත් වී බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය අවතක්සේරු වී යයි.

4. බුදුරජාණන් වහන්සේ සත්‍ය ලෙස ජීවත් වූ කෙනෙකු නොවන බව තහවුරු කර උන්වහන්සේ වදාළ ධර්ම ඇතුළත් ත්‍රිපිටකය ප්‍රබන්ධයක් බව පෙන්වා දුන් විට බුද්ධධර්මය පිළිපැදීම, බෞද්ධ සිරිත් විරිත් අනුගමනය කිරීම තර්කයකින් තොරව නිෂ්ප්‍රභ වී යයි.

5. බුද්ධධර්මය අසා, කියවා, දැනගෙන එය අනුගමනය කරන, බෞද්ධ සංස්කෘතික චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාවට නගන ශ්‍රී ලාංකිකයින් එසේ පිළිගෙන ඇති ධර්මය පදනම් විරහිත අසත්‍ය වූවක් යැයි තහවුරු කර එය ඉදිරිපත් කළ බුදුරජාණන් වහන්සේ ද සත්‍ය ලෙස ජීවත් වූ කෙනෙකු බව ප්‍රකට කළ විට බුදුදහම හා බැඳී ඇති සාහිත්‍යයෙන් හා ජාතික පුරාවිද්‍යාවෙන් හෙළි වී ඇති ශ්‍රී ලංකාවේ ඉතිහාසය ද ප්‍රලාපයක් කිරීම මෙම අලජ්ජීන්ගේ උත්සාහය බව දත යුතුය.

## ඉහත කී කරුණු නැවත එක් කොට මෙසේ තේරුම් ගන්න.

බෞද්ධයින් තුළ ඇති බෝධිසත්ත්ව භාවය පිළිබඳ ආකල්පය පහත වැටුණු විට ඒ හා බැඳී ඇති බුද්ධත්වය පිළිබඳ අදහස අවතක්සේරු වී යයි. බුදුරජාණන් වහන්සේ සත්‍ය ලෙස ජීවත් වී නැති බව තහවුරු කළ විට උන්වහන්සේ විසින් දේශනා කළ ධර්මය ද ඉබේ ම අහෝසි වී යයි. එවිට එම ධර්මය පිළිපැදීම / ඒ අනුව ජීවත් වීම ගැන කවර කථා ද? එයින් ම බෞද්ධ සංස්කෘතිය හා ඊට අදාළ සිරිත් විරිත් සියල්ල පදනමක් නැති ඒවා බවට පත් වෙයි. බුදුදහම හා බැඳී ඇති සාහිත්‍යයෙන් හා පුරාවිද්‍යාවෙන් හෙළි වී ඇති ශ්‍රී ලංකාවේ ඉතිහාසය ද එයින් ම ප්‍රලාපයක් වේ.

## අපේ කාර්ය භාරය කුමක් විය යුතු ද?

**බුද්ධධර්ම සම්බන්ධයෙන් සාවද්‍ය විග්‍රහ ඉදිරිපත් වන්නේ කවර හේතු නිසාදැයි සොයා බැලිය යුත්තෙමු. ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදිය යුත්තෙමු.**

### හේතු හඳුනාගැනීම

(අ) නූතන තාක්ෂණික ලෝකයේ දැනුම ලැබීමේ ක්‍රම ඉතා සීඝ්‍රගාමී ය. ඉතා ඉක්මනින් දැනුම සෙවීමට අද බොහෝ දෙනා කැමති ය. බුදුදහම සම්බන්ධයෙන් ද එය සාධාරණ ය. ප්‍රමුඛ වශයෙන් ගත් කල්හි ධර්ම දේශනය හා සාකච්ඡාව හැරුණු විට ත්‍රිපිටකයේ ඇතුළත් බුද්ධධර්මය විධිමත් පරිදි ශ්‍රාවකයන් වෙත ගෙන යෑමේ මගක් භික්ෂූන් වහන්සේලා තවමත් සකසා ගෙන නැත. අනෙක් පසින් නූතන අධ්‍යාපන ක්‍රියාවලීන්ගෙන් ලැබිය යුතු ඉහළ දැනුම් සම්භාරයන් අත්පත් කරගෙන ඒ හරහා ස්වකීය අවශ්‍යතාවලට ප්‍රමාණවත් හෝ ඊටත් වඩා වැඩි ධන සම්භාරයන් ද රැස්කරගන්නා මිනිසුන්ට අවශ්‍ය මානසික සුවය අත්කර දීමට අවශ්‍ය ධර්මමය වටපිටාවක් නූතන විහාරස්ථාන තුළ ගොඩනැගී නැත. ඉතා වේගයෙන් පූජාචාරිත්‍ර කෙරෙහි ජනතාව ඇදගෙන යන ආගමික පරිසරවලට සීමා වී ඇති විහාරස්ථානවලින් ඉහත කී අවශ්‍යතා ඇති මිනිසුන්ගේ ධර්මමය අවශ්‍යතා සම්පූර්ණ වන්නේ මන්දගාමී ව ය. එවන් අවශ්‍යතා ඇති මිනිසුන්ට පූජාචාරිත්‍රවලින් ප්‍රයෝජනයක් නැත. තමන්ට අවශ්‍ය ධර්මමය අවශ්‍යතාව සපිරෙන තැන් සොයායෑමට ඔවුහු නිරායාසයෙන් පෙළඹෙති. එවන් මිනිසුන් ඉලක්ක කර, එක් පසෙකින් ඔවුන්ගෙන් ලෞකික වාසි (මිල මුදල්, ඉඩකඩම්, වාහන වැනි) ගනු පිණිස හෝ තවත් පසෙකින් තමන්ට සමාජයේ කැපී පෙනෙනු පිණිස හෝ අලජ්ජී ගති ඇති ගිහි පැවිදි පිරිස් සම්බුද්ධ ධර්මය තමන්ට අවශ්‍ය පරිදි පරිහරණය කරති.

(ආ) පසුගිය කාල පරිච්ඡේදයෙහි ශ්‍රී ලංකාව තුළ පතුරුවා හැරීමට උත්සාහ කළ අනාගමික මතවාදයේ එක් පැතිකඩක් ද මේ තුළ දැකගත හැකි බව අපි අමතක නොකළ යුත්තෙමු. ත්‍රිපිටකය බොරු ප්‍රලාපයකැයි ඒත්තු ගන්වා එය දේශනා කළ බුදුරජාණන් වහන්සේ සැබෑ ලෙස ජීවත් වී නැති බව තහවුරු කර ලංකාවේ සිංහලයින් පිළිපදින බුදුදහම හුදු ප්‍රලාපයක් බව ප්‍රකට කරගන්නට හැකි වුව හොත් 'සිංහලයන්ට ආගමක් නැත' යන තැනට කරුණු ගළපා ගත හැකි වෙයි. එවිට අනාගමික මතවාදය ඉබේ ම ක්‍රියාවට නගා ගත හැකි වේ. ඒ සඳහා ක්‍රියාත්මක අදිසි බලවේගවලින් ලැබෙන මහාපරිමාණ මුදල්වලින් ක්‍රියාත්මක වන පුද්ගලයින් ගිහිපැවිදි දෙපිරිස අතර ම සිටිය හැකිය. එහෙයින් අපි ඒ පිළිබඳව ද අවධානයෙන් සිටිය යුත්තෙමු.

### පිළියම් සෙවීම

(අ) විද්‍යුත් මාධ්‍යය හැරුණු විට ශ්‍රවණ ක්‍රියාවලියට ආධාර සපයන වෙනත් සන්නිවේදන මෙවලම් (විනාඩි ගණනකට කෙටි වූ ධර්ම පණිවිඩ විද්‍යුත් මාධ්‍යයට හෝ අන්තර්ජාලයට මුදාහරින්ට අවශ්‍ය සකස් කිරීම්, ජීවන ගැටලුවල දී බුදුදහමෙන් ලැබිය හැකි විසඳුම් ලද හැකි APPS නිර්මාණය ආදිය නිදසුන් වේ) ද අද ඉතා ජනප්‍රිය ව ඇති හෙයින් බුද්ධධර්මය සන්නිවේදනය කිරීමේ දී ඒවා කෙතරම් දුරට භාවිත කළ යුතු ද යන්න දැඩිව සලකා බැලිය යුත්තෙමු. රජයේ ද සහයෝගයෙන් එවැනි දේ ක්‍රියාත්මක කරගැනීමට ශාසනභාරධාරී තෙරවරුන්ට ඒ සඳහා ඉහළ වගකීමක් ඇත. තනි තනි විහාරස්ථාන වශයෙන් ගත් කල්හි තම විහාරස්ථානයට අයත් දායක පිරිස තුළ ඒ සඳහා හැකියා ඇති පිරිස් වේ නම් විහාරස්ථාන මට්ටමින් ක්‍රියාත්මක විය හැකිය. විශේෂයෙන් ම නූතන තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ ඉහළ පරිචයක් ඇති තරුණ ප්‍රජාව ඒ සඳහා යොදාගැනීම වඩාත් පල දායක වේ.

(ආ) බුද්ධධර්මය ඇතුළත් ත්‍රිපිටකය පූජනීයත්වයෙන් පමණක් නොසලකා ජනතාවට තේරුම්ගත හැකි පරිද්දෙන් සාකච්ඡාවට ගත යුතු ම වේ. ධර්මදේශනය හෝ සාකච්ඡාව ඊට ප්‍රමාණවත් නොවේ. කැමති මිනිසුන්ට ධර්ම හැදෑරීමට අවශ්‍ය වටපිටාව විහාරස්ථානවල ඇති කළ යුතුය. සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර ඉගෙනීමට අවශ්‍ය කටයුතු මහාසංඝයා විසින් සම්පාදනය කරගත යුතු වේ.

(ඇ) කාර්ය බහුල සංකීර්ණ ජීවිත ගත කරන මිනිසුන්ට මානසික සුවය උදාකරගත හැකි සරල වූ සන්සුන් විවේකස්ථාන ඇති කොට විධිමත් උපදෙස් අනුව ජනතාවට සමතුලිත ජීවන රටාවක් ගොඩනගාගන්නට මග දැක්විය යුතු වේ.

**ත්‍රිපිටකයේ ඇතුළත් ධර්මයට විරුද්ධව නැගෙන මතවාද දුරු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුත්තෙමු.**

- **අපේ මුතුන්මිත්තන් කළ දෑ**

පාලි ත්‍රිපිටකයට විරුද්ධව මතු වූ සියලු දුර්මත පරාජය කිරීමට ද ලංකාවාසීහු දිවිහිමියෙන් ක්‍රියා කළහ. ක්‍රි.ව. 209 දී රජ පැමිණි වෝහාරික තිස්ස රජුගේ කාලයෙහි ලක්දිව ව්‍යාප්ත වූ වෛතුල්‍යවාදීන් මර්දනය කරන ලද්දේ රජුගේ උපදෙස් ඇතිව කපිල නම් ඇමතිවරයා ය. එහි දී වෛතුල්‍යවාදී අදහස් ගත් භික්ෂූහු 60 දෙනෙක් හංවඩු ගසා රටින් පිටුවහල් කරන ලදහ. සිලාකාල රජ දවස ක්‍රි.ව. 535 දී පූර්ණ නම් වෙළෙන්දා ඉන්දියාවෙන් මෙරටට ගෙන ආ පාලි ත්‍රිපිටකයට පටහැනි වූ ධර්මධාතු නම් ග්‍රන්ථය විනාශ කර බුද්ධධර්ම සුරක්ෂිත කෙරිණ. ක්‍රි.ව. 575-608 කාලයේ දී රජකම් කළ පළමු අග්බෝ රජ දවස ඉන්දියාවෙන් මෙරටට පැමිණි ජෝතිපාල තෙරණුවෝ ථේරවාදයට විරුද්ධව ලක්දිව ප්‍රචලිත වෙමින් තිබූ මහායානය වාද කොට රාජකීය අනුග්‍රහය ඇතිව මර්දනය කළහ. මෙසේ පාලි ත්‍රිපිටකයට පටහැනිව පැන නැගුණු සියලු විරෝධ පරාජය කරන්නට මහාසංඝයා ත් රජ මැති ඇමතිවරුන් හා ජනතාව ත් කැප වී ක්‍රියා කළා සේ අපි දු ක්‍රියා කළ යුත්තෙමු.

### අපි කළ යුතු දෑ

1) ත්‍රිපිටකය බුද්ධශ්‍රාවක වූ අප විසින් දිවි හිමියෙන් රැකිය යුත්තකි. ඒ සඳහා අප අතර ඇති සියලු වාද භේද දුරලිය යුත්තෙමු. ග්‍රාමවාසීන්ගේ ද අරණ්‍යවාසීන්ගේ ද පරම වගකීමක් විය යුත්තේ පර්යාප්ති ධර්ම රැකගැනීම යි. ප්‍රතිපත්තිය රැකෙන්නේ පර්යාප්ති ධර්මය නිර්මලව පවතින්නේ නම් පමණි. නිකායික වශයෙන් හෝ පාර්ශ්වීය වශයෙන් හෝ පළාත් වශයෙන් හෝ මහාසංඝයා අතර ඇති සියලු භේදයන් පසෙක ලා ත්‍රිපිටකයට හා ත්‍රිපිටකධර්මයට එල්ල වන අභියෝග අපි ජයගත යුත්තෙමු.

2) ශ්‍රී ලාංකේය සමස්ත සංඝයාගේ අනුමැතියෙන් ශාසනභාරධාරී මහතෙරවරු වහා මෙහෙය වී රජයේ පූර්ණ මැදිහත්වීම මත ත්‍රිපිටකයට විරුද්ධව අදහස් ඉදිරිපත් කරන අලජ්ජීන් එක්කෝ ශාසනයෙන් නෙරපාලිය යුත්තාහ. නැතහොත් ධර්මවාදී ගණයට අනුකූල කරවා ආයති සංවරයෙහි පිහිටවිය යුත්තාහ. යම් හෙයකින් එසේ ආයති සංවරයෙහි පිහිටන පිරිස් වෙත් නම් සංඝ මණ්ඩලයක පූර්ණ අධීක්ෂණය මත නියම කරනු ලබන පරිවාස කාල පරිච්ඡේදයක තැබීම වඩා යෝග්‍ය වේ.

60th Anniversary USJP

# ICOL 2019

# International Conference on Oriental Languages

**Sinhala, Pali, Sanskrit, Prakrit, Tamil**

Organized by the

Department of Pali & Buddhist Studies
University of Sri Jayewardenepura

on

## 20th February 2019

**@Sumangala Reading Hall**

Papers can be presented in Sinhala, Pali, Sanskrit, Prakrit & Tamil.

Extended Abstracts should be forwarded to icol60.usjp@gmail.com on or before deadline.

Extended Abstracts should be around 1500 words.

Font : Times EXT Roman and FMAbhaya

Deadline for Extended Abstracts
**05th January 2019**

Notification of Acceptance
**30th January 2019**

**Conference Chair :**
**Prof. Ven. Medagoda Abhayatissa**
DPBS-FHSS@USJP
Voice : +94718666333

**Coordinator :**
**Mr. Dilan Panchana Jayasinghe**
DPBS-FHSS@USJP
Voice : +94712992130 / +94773837329